පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.02 පැය 1335 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/621/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීමක් සම්බන්ධ සිද්ධියට අදාල සැකකරුවන් පස්දෙනෙකු හා එක් සැකකාරියක් අත්අඩංගුවට ගැනිම - නිලාවේලි පොලිස් ස්ථානය

2025.03.31 වන දින නිලාවෙලි පොලිස් වසමේදී නිල ඇඳුමින් සැරසී සිටින පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට යම් පිරිසක් බාධා කරමින් එම පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පෑම සිදු කරන වීඩියෝ පටයක් මෙම දින වල සමාජ මාධ්‍ය වල සංසරණය වෙමින් පවතී.

මෙම සිදුවීම සම්බන්ධයෙන් නිලාවේලි පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විමශර්න ආරම්භ කර එක් සැකකරුවෙකු 2025.03.31වන දින අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට වෙත ඉදිරිපත් කිරමෙන් පසු 2025.04.03 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලදී.

මෙම සිද්ධියට සම්බන්ධ අනෙක් සැකකරුවන් ප්‍රදේශය මගහැර ගොස් සිටියදී නිලාවේලි පොලිස් ස්ථානය විසින් විමශර්න පවත්වා සැකකාරියක් හා සැකකරුවන් 05 දෙනෙකු 2025.04.01 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 35 ක් වන හා සැකකරුවන් අවුරුදු 20,21,22,28 හා 45 යන වයස් වල පසුවන නිලාවේලි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සිද්ධියට සම්බන්ධ තවත් සැකකරුවන් දෙදෙනෙකු හඳුනාගෙන ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා නිලාවෙලි පොලිසිය වැඩිදුර විමශර්න පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**